මහාචාර්ය
## දයා රෝහණ අතුකෝරල

# රට වෙනුවෙන් අප කුමක් කළ යුතුද?

"රට මා වෙනුවෙන් කළේ කුමක්ද යනුවෙන් ප්‍රශ්න කරනු වෙනුවට රට වෙනුවෙන් මා කළේ කුමක්ද යන ප්‍රශ්නය අප හැම අයකු විසින්ම අපගෙන්ම අසාගත යුතු යයි ඇමරිකාවේ හිටපු ජනාධිපතිවරයකු වූ රූස්වෙල්ට් වරෙක ප්‍රකාශ කර තිබුණි. මාස හයක නිවාඩුවකට මා ඕස්ට්‍රේලියාවට පැමිණ සිටින මේ කාලයේ විවිධ ජන මාධ්‍ය සමග සම්බන්ධ වෙමින් විවිධ සංස්කෘතික සංවිධාන සමග සාකච්ඡා පවත්වමින් සංවිධානය කළ ආයතන, විහාර කිහිපයක දේශන පවත්වමින්, ඕස්ට්‍රේලියාවේ ජීවත් වන අපගේ පැරණි හිත මිතුරන්, පාඨකයින් සහ ශ්‍රාවකයන් සමග යළි ඇසුරක් පවත්වාගෙන යාමට ලැබීම සතුටට කරුණක් විය.

මෙම කාලය තුළ මගේ හිත මිතුරන් සමග සාකච්ඡා කළ පසු මෙවන් ලිපියක් පුවත්පතකට ලිවීම මැනවැයි ඔවුන් කළ යෝජනාවකට අනුව මෙය ලියමි.

මෙහි සිටින සියළුම ශ්‍රී ලාංකිකයන් වන, ඔබද මාද ඇතුළු සියළු දෙනාගේ මව්බිම ශ්‍රී ලංකාවයි. අප ඉපිද, හැදී වැඩී පෝෂණය වූ රට එයයි. ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රටක සිටින විට ශ්‍රී ලංකාවේ උරුමය අරුමය ඔබට දැනෙනවා ඇතැයි සිතමි. ශ්‍රී ලංකාවේ අපටම ආවේණික වූ උදාර උරුමයක් සංස්කීකයක් අපට ඇත. ඉතා සමීප පවුල් සබඳතාවයක් පමණක් නොව, හිත මිතුරු අසල්වැසි ප්‍රජාවක්ද අපට ඇත. ගෙදර දොර ඇරගෙන පාරට එනවිටම කී දෙනෙකු අපට මුණ ගැහෙනවාද ? "ආ මල්ලී බෑරක්ද ? අද දුර ගමනක් යන්න වගෙයි ?" ආදී සුහඳ කතාබහක්, මුව පුරා නැගුණ සිනහවක් අපට පාර තොටේදී නොවරදින දවසක් නැත. මිත්‍රශීලිකම, ලෙන්ගතුකම, හිතවත්කම වචනයෙන් පමණක් නොව හදවතින්ම අපට විඳගත හැක්කේ ශ්‍රී ලංකාවේදී මිස අන් කවර රටේද? මා රටවල් අටකට පමණ සංචාරය සඳහා, නිවාඩු සඳහා, සම්මේලන සඳහා ගොස් ඇත. බොහෝ රටවලදී දැකගත හැකි වන්නේ මහා සෙනග මැද හුදකලා වූ බවකි. එය විදේශිකයන් වන අපට පමණක් නොව එරට වැසියන්ටද එසේම බව ඔවුන්ගේ කථාවලින් පැහැදිලි විය. අපේ රටේ මිනිසුන් අඩු තරමින් සිනාසෙන මිනිසුන්ය. අමුත්තෙකු මුණ ගැසුන විට කටපුරා සිනා සීමට හුරුවක් ඇත. සිනාසීම යනු හදවතේ ඇති ලෙන්ගතුකම බැහැරට විද්‍යාමාන වීමකි. වෙන කිසිදු රටක එලෙස ලෙන්ගතුව සිනාසෙන ජාතියක් මට මුණ ගැසී නැත. නේපාලයේදී, ඉන්දියාවේදී නම් යම් තරමකට දැකගත හැකි විය. වරෙක ඕලන්දයේ ආනන්ද හිමියන් ඉංග්‍රීසි පුවත්පතක් සමග කළ සාකච්ඡාවක් මට කියවන්නට ලැබුණි. පුවත්පත් වාර්තා කරුවා ඒ හිමියන්ගෙන් විචාලේ, ඕලන්දයේ සිට මහණ වීමට ශ්‍රී ලංකාව තෝරා ගත්තේ කුමක් නිසාද යයි කියාය. උන් වහන්සේ ගත් කටටම පිළිතුරු දී තිබුණේ ශ්‍රී ලංකාව "සිනාසෙන රටක්ය" :ඕමටයසබට කදමබඑරහ* යනුවෙනි. වර්තමානයේ ලෝකයේ සංවර්ධනය මනින දර්ශක වෙනස් වෙමින් ඇත. ඒ අනුව සතුටේ දර්ශකය :ෂබාැං දබ ්චචසබී* හා හරිත් දර්ශකය :ෂබාැං දබ ඨරුැබ* සඳහා මුල් තැනක් ලැබේ. එම දර්ශක දෙක අනුවම ශ්‍රී ලංකාවට ලැබී ඇත්තේ ඉහළ අගයයකි.

ශ්‍රී ලංකාවේ මේ සුන්දරත්වය, අනන්‍යතාව, විශිෂ්ඨත්වය වර්ධනය කරලීමට වචනයකින්, කතාවකින් හෝ ලිපියකින් හෝ උදව් කිරීම ඔබටත් මටත් උපන් රටට කළ හැකි අනගි මෙහෙයකි. ශ්‍රී ලංකාව, ඉතිහාසය පුරාම විවිධ ආක්‍රමණවලට මුහුණ දුන් හා ඒවා ජයගත් අභීත දිවයිනකකි. මහා ඇලෙක්සැන්ඩර් රජ දවසද ශ්‍රී ලංකාව හැඳින්වූයේ "පෙරදිග තිබෙන පාරාදීසයක්" යනුවෙනි. මාර්කෝසේල්, හියුංචිං, පාහියං ප්ලිනි ක්ලෝඩියස් ආදී විදේශ සංචාරකයන් ලියූ ලිපි ලේඛන වල ශ්‍රී ලංකාව සඳහන් කර ඇත්තේ අති රමණීය, සුන්දර පාරාදීසයක්, කාරුණික මිනිසුන් ජීවත්වන, මැණික් රටක් ලෙසය. ඒ සොබා දායාදයන් එකතු කරගෙන යාම සේද මාවතේ ------- ස්ථානයක පිහිටි අප රටට බොහෝ දෙනා ගොඩ බට බව දැනට ඉතිරිව තිබෙන ලිපි ලේඛන වලින් අනුමත කළ හැකිය.

වර්තමානයේ හම්බන්තොට වරාය සාදා ඇති භූමියට ආසන්න එක් නැවතුම්පලක් බව ලිපි ලේඛන වලට සඳහන්ව තිබුණි. දැනට මාස කිහිපයකට පෙර එම පෙදෙසට ආසන්න මුහුදේ ගොඩබිම සිට සැතපුමක් තරම් ආසන්නයේ හමු වූ දුටුගැමුණු අවදිය තරම් ඈතට දිවෙන ඉතිහාසයක් ඇති බිඳුන නැවක් මුහුදින් මතු කරගනු ලැබිණි. මේ උදාර ඉතිහාසය සහිත අප රට අපගේ ජීවිත කාලය තුළ යළි ලෝක සිතියමේ ඉහලට ඔසවා තැබුමට ඔබටත් මටත් යුතුකමක් හා වගකීමක් ඇත.

මෙහි සිටින ඔබ හැමදෙනා අප රටේ සිටින ජන කණ්ඩායමේ වාසනාවන්තම පුරවැසියන්ය. එම රටෙහි ඉපිද, ශ්‍රී ලංකා පොළොවේ වැවුණු වී, අල, බතල, කුරක්කන්, මුං ඇටකා හැදී වැඩී, එරට පාසල්වල නොමිලයේ අධ්‍යාපනය ලබා ඇස් පාදගෙන විභාග සමත් වී, ඒ සහතිකය පෙන්වා මෙරටට පැමිණි වාසනාවන්තයින්ය. සරුංගලය උඩ තිබුණත් නූල තවම තිබෙනුයේ අප රටේය. ඔබට උඩ යාමට උදව් කළ අප රටට යළි සේවය කිරීමට කාලය පැමිණ ඇත.

*1912 දී ශ්‍රී ලංකාවට පැමිණ දින කිහිපයක් ගෝල්ෆේස් හෝටලයේ නැවතී සිට ආපසු රුසියාවට ගිය මහා ගත් කතුවර ඇන්ටන් චෙකෝෆ් ලියා ඇත්තේ, " ඔබට සුරපුරය බලන්න නොලැබෙන්නේ නම් ශ්‍රී ලංකාව (සිලෝන්) බලන්නය" කියාය.*

කට ඇර ආඩම්බරයෙන් ඔබ ශ්‍රී ලාංකිකයෙකු බව ඕනෑම රටක දී ඔබට කිව හැකිය. මා ගිය හැම රටකදීම ශ්‍රී ලාංකිකයන් ගැන විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්, ආයතන ප්‍රධානීන් කතා කරන්නේ ඉහළ වටිනාකමක් දීය. ඕස්ට්‍රේලියාවේ ඔබටත් ඒ අත්දැකීම තිබෙන බව මම දනිමි. ශ්‍රී ලාංකිකයන් ඉගෙනීමෙහි දක්ෂ බව, සේවයෙහි දක්ෂ බව, කරදර අඩු, ආයතනවලට ලැදි අය බව ඔබටත් අසන්නට ලැබී ඇත.

ඔවුන් අපට දෙන ගෞරවය අපි නැති කළ යුතු නැත. ඕනෑම රටක අඩුපාඩු. ගැටළු, පසුබෑම් තිබිය හැකිය. යම් යම් පුද්ගලයන්ගේ හොඳ මෙන්ම නරක ද තිබිය හැකිය. එසේ වීම ස්වාභාවිකද වේ. බෞද්ධ ඉගැන්වීම අනුව නම් රහතුන් වහන්සේ නමක් වනතුරුම මිනිස්සු අතින් වැරදි සිදුවෙති. මිනිස්සු එති යති. එහෙත් රටක් පවති. අප සියළු දෙනා එක් එක් මිනිසුන් ගේ අඩු ලුහුඩුකම් කතා කරමින් රටම හෑල්ලු කරමින් කරන කතාවලින් අපි අපටම කෙළ ගසා ගනිමු.

ළගකදී ලංකාවට ආ ඉන්දියානු විපක්ෂ නායිකාව, ඕස්ට්‍රේලියා විපක්ෂ නායකතුමා, ඇමරිකාවේ විපක්ෂ මන්ත්‍රී කණ්ඩායම කිසිදු විටක ශ්‍රී ලංකාවේ දී තම රට ගැන කිසදු විවේචනයක් කළේ නැත. වසරකට ස්ත්‍රී දූෂණ (2010) 84,767 ක් සිදුවන, වැඩිහිටියන්ගෙන් 33% ක් මානසික ආබාධවලට බෙහෙත් ගන්නා හා 2008, 2009 වසරවල 36,900 ක් සිය දිවි නසා ගන්නා රටක් බවට ඇමරිකාව පත්ව තිබුණාද, ඔවුහු තම රට ගැන පිටරටවලදී කිසිදු අඩුවක් කතා නොකරයි. ඒ ඔවුන් තම රටට ආදරේ නිසාය. අඩු පාඩු ඇති බව සැබෑ වුවද එය හත් පොලේ ගාගන්නේ නැත.

අපිදු අප රට ගැන, විශේෂයෙන්ම පිටරට සිට කරන විවේචන වලින් අප දැනට දිනාගෙන තිබෙන හොඳ නම පළුදු නොකරමු. මේ බවට වරෙක ඉන්දියාවේ සිටි විශ්ෂ්ඨ ජනාධිපතිවරයකු වූ ආචාර්ය අබ්දුල් කලාම් කළ ප්‍රසිද්ධ කතාවකදී සඳහන් කර ඇත. "ඉන්දියාවට කෙළ ගහන්න එපා" යයි පළවූ එම පුවත්පත් සාකච්ජාවේදී ඔහු පැවසූවේ තම රට අපවිත්‍ර නොකර, අගෞරව නොකර, රටේ අභිමතය නංවා ලීමට කටයුතු කරන ලෙසයි.




අපගේ රටවල උගත්කම අඩු

බහුතරයක්

කාන්තාවෝ ගෘහ සේවිකා රැකියාවලට ගොස් උපයන මුදල් සියල්ලම පාහේ යළි මව් රටට එවති. එය අපගෙ රටේ ප්‍රධාන විනිමය ආදායමකි. එහෙත් සංවර්ධිත රටවල රුපියල් ලක්ෂ පහ හයකට වඩා උපයන අප කී දෙනෙක් අප උපන් රටට අප හඳා වඩා ඉගැන්වූ රටට අපට අල බතල කන්න දී උස් මහත් කළ රටට යවන්නෙමුද? අප හැම දෙනාගේ රටට අපට ආදරය කළ හැක්කේ අපගෙන් ආපසු රටට දායකත්වයක් ලබා දීමෙනි.

ඕනෑම ආයතනයක්, රටක් දියුණු වනුයේ අප රටින් ගත් ආදායමට වඩා රටට අපෙන් දායක වන කොටස වැඩි වූ කල්හිය. ඔබ සමහර විට ඒ යුතුකම ඉටු කරනවා වන්නට පුළුවන. හෘදය සාක්ෂියට කතා කර බැලුවහොත් ඒ රටේ ඉඩම් විකුණා, ගෙවල් විකුණා තිබෙන සියළු මුදල් මෙහෙ ගෙන්වා ගත්තා හැර අඩු තරමින් ගෙන්වා ගත් මුදලවත් යවා ඇත්ද? යවා නැතිනම් දෙගුණයක් අපි අපේ රටට ගෙන යායුතු වෙමු.

ජාතියට ණය කාරයකු නොවිය හැක්කේ එවිටයි. අපගේ ආපසු දායකත්වය අප ලබාගත් ප්‍රමාණයට වැඩිවිය යුතුමය. ඔබට එම මුදල විවිධ හැකිය. දුප්පත් ළමයින්ට ඉගෙනීමට උදව් උපකාර කළ හැකිය. පාසල්, රෝහල් වැඩි දියුණු කළ හැකිය. ඔබගේ මුදල් පමණක් නොව ඔබේ දැනුම, නව දැනුම අප රටට දායාද කළ හැකිය.

ඔබට කළ හැකි දේ අපමණය. සුළු සුළු අඩුපාඩුකම්, වැරදීම්, පුද්ගල වෛර නිසා රටක් ජාතියක් අවඥාවට, අවමනට ලක් නොකර, අප උපන් හැදුන වැඩුන හා අපේ දූ දරුවන්ට අභිමානයෙන් හඳුන්වා දිය හැකි විය යුතුය. වසර 2600කට වඩා පැරණි සෞභාග්‍යයෙන් අනූන වූ "ලෝකයේ පාරාදීසය" ඔබේ දරුවන්ට ඔබ හඳුන්වා
දෙන්නේ කෙසේද? ඔබට අභිමානයක් ලැබෙනුයේද අභිමානවත් රටක පුරවැසියකු වීම නිසාය.

ඔබත් තනිතනිවත්, සාමූහිකවත්, ශ්‍රී ලංකාව ලෝකයේ පාරාදීසය ලෙස අතීතයේ හිමි කරගෙන තිබූ උදාර නාමය යළි මතුකර දීමට දිරි දෙන්න. 1912 දී ශ්‍රී ලංකාවට පැමිණ දින කිහිපයක් ගෝල්ෆේස් හෝටලයේ නැවතී සිට ආපසු රුසියාවට ගිය මහා ගත් කතුවර ඇන-"ටන් චෙකෝෆ් ලියා ඇත්තේ, "ඔබට සුරපුරය බලන්න නොලැබෙන්නේ නම් ශ්‍රී ලංකාව (සිලෝන්) බලන්නය" කියාය.

අපිත් අප දරුවන්ට ඒ සුරපුරය බලන්නට අපට කළ හැකි උදව් කරමු. අභිමානවත්, උදාර සංස්කෘතියක් ඇති රටක උරුමකරුවන් ඇති අපි, අප සැමට කළ හැකි දායකත්වයක් කරමු.

නැවුම් පුවත් හරවත් සාකා ඛහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
සිංහලෙන් පැය දෙකක්
FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

රංජිත් රූබි සමග පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම
සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න